# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1975/8 - 2016 ජූලි මස 11 වැනි සඳුදා - 2016.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මාතර IV වන අදියර ජල සම්පාදන ක්‍රමය යටතේ තුළුමං ළිඳ හා පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් දෙකෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 ජූලි මස 01 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1173.

### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 350A කටුවන්ගොඩ ග්‍රාම නිලධාරී වසමේ මාලිම්බඩ කටුවන්ගොඩ ගමේ පිහිටි හෙට්ටිගේ වත්ත නමැති ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු චින්තරත්න රංගොඩගේ මහතා විසින් පිළියෙල කරන ලද අංක 31 දරන පිඹුරේ කැබලි අංක 3c හා 3d ලෙස පෙන්නුම් කෙරෙන සම්පූර්ණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0846 (පර්චස් 34) ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස් දෙක :

01. කැබලි අංක 3c - ප්‍රමාණය : හෙක්ටයාර් 0.0814 (පර්චස් 32.20) පමණ

| | | |
|---|---|---|
| *උතුරට* | : | නිවාස වල සිට ප්‍රධාන පාර දක්වා දිවෙන ප්‍රාදේශීය සභා පාර සහ එම ඉඩමේ කැබලි අංක 2 කොටස (සැලසුම් අංක 1410) ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ කැබලි අංක 4 කොටස (සැලසුම් අංක 1410) ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ කැබලි අංක 4 කොටස (සැලසුම් අංක 1410) ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ කැබලි අංක 2 කොටස (සැලසුම් අංක 1410). |


1A - G 23798 — 17 (2016/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනය* : කේ. කේ. නිලන්ත ලක්මාල් මහතා,
පැලවත්ත, කිතලගම නැගෙනහිර III,
තිහගොඩ.

02. කැබලි අංක $3^{d}$ - ප්‍රමාණය : හෙක්ටයාර් 0.0032 (පර්චස් 1.29) පමණ

| | |
|---|---|
| *උතුරට* | : මෙම ඉඩමේ කැබලි අංක $3^{c}$ කොටස ; |
| *නැගෙනහිරට* | : මෙම ඉඩමේ කැබලි අංක 4 කොටස (සැලසුම් අංක 1410) ; |
| *දකුණට* | : මෙම ඉඩමේ කැබලි අංක 4 කොටස (සැලසුම් අංක 1410) හා නිවාස වල සිට ප්‍රධාන මාර්ගයට වූ පාර ; |
| *බටහිරට* | : නිවාස වල සිට ප්‍රධාන මාර්ගයට වූ පාර. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනය* : කේ. කේ. නිලන්ත ලක්මාල් මහතා,
පැලවත්ත, කිතලගම නැගෙනහිර III,
තිහගොඩ.

07 - 981

---

## 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

### 92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ගෝනගල මැදගොඩ ජල සම්පාදන ක්‍රමයේ නල ළිඳ හා පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 ජූලි මස 01 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1183.

### උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදගොඩ - 103 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මැදගොඩ ගමේ පිහිටි ඉලුවේවෙලවත්ත නමැති ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු ජී. එම්. කේ. තෙන්නකෝන් මහතා විසින් පිළියෙල කරන ලද අංක KE/2012/01 පිඹුරෙහි දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 12.6 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | |
|---|---|
| *උතුරට* | : මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : කැළණි ගඟ ; |
| *දකුණට* | : ඩබ්. ඒ. රංජිත් මහතා හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : ප්‍රධාන මාර්ගයේ සිට මීතිරිගලට මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ඩබ්. එම්. ඩී. නිහාල් විජේමාන්න මයා,
මැදගොඩ,
අමිතිරිගල.

07 - 982

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.